**ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපනය ගුණාත්මක සහ විනිවිදභාවයකින් යුතුව පවත්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගෙන ඇති 16 වැදැරුම් වැඩපිළිවෙල**

කාල පරිච්ඡේදය : 2015 මාර්තු මස 09 වන දා සිට 2016 දෙසැම්බර් 31 වන දින දක්වා

## 1) උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අවස්ථාවන් පුළුල් කිරීම.

i ඉහත කාල පරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වැඩි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව - 5564

- තාක්ෂණවේදය - 2030
- වෛද්‍ය විද්‍යාව - 70
- විද්‍යාව - 575
- ඉංජිනේරු - 208
- කෘෂි විද්‍යාව - 45
- වාස්තු විද්‍යාව/ නිර්මාණ/ නගර සහ ග්‍රාම සැලසුම්කරණය - 20
- පරිපූරක වෛද්‍ය - 170
- කළමනාකරණය සහ වානිජ්‍යය - 590
- මානව සහ සමාජ විද්‍යාව - 1816
- සිද්ධ වෛද්‍ය විද්‍යාව - 40

ii නව පීඨ, අධ්‍යයනාංශ සහ උපාධි පාඨමාලා ආරම්භ කිරීම.

*ස්ථාපිත කළ නව පීඨ - 12 :*

- ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- පරිගණක හා තාක්ෂණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
- තාක්ෂණ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර, යාපනය, රුහුණු, කොළඹ, අග්නිදිග සහ නැගෙනහිර විශ්වවිද්‍යාලවල
- හෙද පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- වෛද්‍ය පීඨය, වයඹ විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය

*අනුමත කළ නව අධ්‍යයනාංශ - 61 :*

- කොළඹ විශ්වවිද්‍යාලය - 11
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 01
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 09
- කැලණිය විශ්වවිද්‍යාලය - 04

- මොරටුව විශ්වවිද්‍යාලය - 04
- යාපනය විශ්වවිද්‍යාලය - 03
- රුහුණු විශ්වවිද්‍යාලය - 05
- නැගෙනහිර විශ්වවිද්‍යාලය - 03
- අග්නිදිග විශ්වවිද්‍යාලය - 03
- වයඹ විශ්වවිද්‍යාලය - 18

*අනුමත කළ නව උපාධි පාඨමාලා - ප්‍රථම උපාධි -30, පශ්චාත් උපාධි - 17 :*

- කොළඹ විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 03 පශ්චාත් උපාධි - *04*
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය - පශ්චාත් උපාධි - 03
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 04, පශ්චාත් උපාධි - 02
- කැලණිය විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 03, පශ්චාත් උපාධි - 04
- යාපනය විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 04
- මොරටුව විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 01, පශ්චාත් උපාධි - 01
- රුහුණු විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 03, පශ්චාත් උපාධි - 01
- නැගෙනහිර විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 01
- අග්නිදිග විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි -02
- රජරට විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 03
- වයඹ විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 03
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 02
- සබරගමුව විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 01, පශ්චාත් උපාධි - 02

**2) විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලිය නව ක්‍රමවේදයක් තුළින් නව්‍යකරණය කිරීම.**

i සිසුන්ට පහසුවෙන් කියවා අවබෝධ කරගත හැකි ලෙස විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත සරළ බසින් හඳුන්වා දීම.

ii විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කර ගැනීම සඳහා සෑම විශ්වවිද්‍යාලයකම ඇති පාඨමාලාවන් සඳහා යුනිකෝඩ් කේත හඳුන්වා දීම.

**3) ආයතනික ක්‍රියාවලියේ පරිපාලනය විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම.**

i විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සියළුම සිසුන් එකම දිනයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ගැනීමට කටයුතු කිරීම.

ii විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන සිසුන්ට තම අධ්‍යයන පාඨමාලාව සහ ඔවුන් කැමති විශ්වවිද්‍යාල ද ඔවුන්ගේ මනාපය පරිදි තෝරගැනීමට ඉඩ සලසා දීම. මින් පෙර සිසුන්හට අවස්ථාව ලබා දී තිබුනේ සිසුන් කැමති පාඨමාලාව තෝරා ගැනීම සඳහා පමණි.

iii විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන්හට අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට හා ලියාපදිංචි වීමට ක්‍රමවේදයක් හඳුන්වා දීම.

**4)** **අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම හා සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කිරීම අතර කාල පරාසය අඩු කිරීම.**

i විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාවය පහත පරිදි වැඩි කිරීමට කටයුතු යොදා ඇත.

- විශ්වවිද්‍යාල ප්‍රවේශ දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු කඩිනමින් සහ පහසුවෙන් ඉටු කිරීම සඳහා ඉඩ පහසුකම් එම දෙපාර්තමේන්තුවට ලබාදීම සහ නව ආරක්ෂක ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- විශ්වවිද්‍යාල ප්‍රවේශ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා පරිගණක තාක්ෂණය පිළිබඳ විශේෂ දැනුමක් ඇති කාර්යමණ්ඩලයක් කඩඉම් විභාගයකින් හා විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මඟින් අනුයුක්ත කර ගැනීම.

ii විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන්ට අන්තර්ජාලය හරහා අයදුම් කිරීම හා ලියාපදිංචි කරගැනීම හඳුන්වාදීම තුලින් විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාදාමය කඩිනම් කිරීම මෙන්ම, අසත්‍ය තොරතුරු සපයා ඇති අයදුම්පත් ඉක්මනින් හඳුනා ගැනීමටත්, පෙර පැවති ක්‍රමයේ අඩුපාඩු මඟ හරවා ගැනීමටත් හැකිවීම.

iii දිවයින පුරා ඇති පළාත් හා කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන, සහ නැණසල මධ්‍යස්ථාන මඟින් සිසුන් හට නොමිලේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත අන්තර්ජාලය හරහා යොමුකිරීමට ලබාදෙන සහාය වෙනුවෙන්, එම මධ්‍යස්ථාන සඳහා ඇගයුම් පදනම මත ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.

iv සියලු විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු 2017 වර්ෂයේ ඔක්තෝබර් මස පළමුවන දින ඇරඹීමට විශ්වවිද්‍යාල පාලනාධිකාරී (උපකුලපතිවරුන් සහ පීඨාධිපතිවරුන්) සමඟ එකඟතාවයකට එළැඹීම.

v අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රශ්ණ පත්‍ර වල නැවත සමීක්ෂණ කටයුතු කඩිනම් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය අතර ඉහළ සම්බන්ධීකරණ ක්‍රියාවලියක් ඇති කිරීම.

vi සිසුන් විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් කර ගැනීම හා අධ්‍යයන පාඨමාලා ඉක්මනින් ආරම්භ කිරීම සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නව අභ්‍යන්තර ක්‍රමවේදයන් හඳුන්වා දීම මඟින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ කඩඉම් ලකුණු ප්‍රකාශයට පත්කිරීම කඩිනම් කිරීමටත්, විශ්වවිද්‍යාල ප්‍රවේශයේ පුරප්පාඩු පිරවීම කඩිනම් කිරීමටත්, අවසාන ලියාපදිංචි සිසුන්ගේ නාමලේඛණ විශ්වවිද්‍යාල වෙත යැවීම කඩිනම් කිරීමටත් කටයුතු සිදු කිරීම.

**5)** **විශ්වවිද්‍යාල අධ්‍යාපනය රැකියා වෙළඳපලට ගැළපෙන ලෙස වැඩිදියුණු කිරීම: කුසලතා නොගැලපීම නැති කිරීමට කටයුතු කිරීම.**

i ජාතික හා කලාපීය වැදගත්කමකින් යුත් නව උපාධි පාඨමාලා හඳුන්වා දීම.

- තාක්ෂණවේදය විෂය ධාරාවට අයත්, ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදය යටතේ, නව උපාධි පාඨමාලා 25 ක් හඳුන්වාදීම.

- නව තාක්ෂණ පීඨ 7ක් කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, කැළණිය, රුහුණු, යාපනය, නැගෙනහිර හා අග්නිදිග යන විශ්වවිද්‍යාලවල පිහිටුවීම.
- වයඹ විශ්වවිද්‍යාලයේ නව වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමට මූලික පියවර ගැනීම.

ii දැනට පවතින මානව හා සමාජ විද්‍යා උපාධි පාඨමාලාවල විවිධාංගීකරණය කිරීමේ ක්‍රමවේදය යටතේ ඒ පාඨමාලාවන් සඳහා ඇතුලත්වන සිසුන් ප්‍රමාණය අඩු කිරීමක් නොකර, ඔවුන්ගේ හැකියාවන් හා නිපුණතාවයන් වැඩිවන අයුරින් එම උපාධි පාඨමාලා සඳහා මූලික ගණිතය, සංඛ්‍යානය, තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි යන විෂයන් අනිවාර්ය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

**6. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයේ ගුණාත්මකභාවය සහ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම.**

i විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය මඟින් සිදුකරන ගුණාත්මක බවින් ඉහළ පර්යේෂණයන් සඳහා ඇගයුම් පදනම යටතේ ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම.

ii කථිකාචාර්යවරුන් සඳහා පශ්චාත්/ ආචාර්ය උපාධි, විදේශ රටවල සහයෝගය ඇතිව ලබාදීමට, අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදීම. ඉහත කාල පරිච්ඡේදය තුළ එම මූල්‍ය ප්‍රතිපාදන 188 දෙනකුට දී ඇති අතර, එහි මුළු වටිනාකම රුපියල් මිලියන 342ක් විය.

iii විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ජර්මනිය, ජපානය හා ඔස්ට්‍රේලියාව යන රටවල් මඟින් සම්පූර්ණ / අර්ධ විදේශීය ශිෂ්‍යත්ව යටතේ ආචාර්ය උපාධි ලබාගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම.

iv විශ්වවිද්‍යාල තුළ පශ්චාත් උපාධි විද්‍යාගාර සංවර්ධනය කිරීමේ අරමුණින් විදේශ ආධාර ලබාදෙන රටවල්වල (එනම් දකුණු කොරියාව, චීනය) විශ්වවිද්‍යාල සමඟ සබඳතා ඇතිකර ගැනීම.

**7. රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති තත්ත්ව ආරක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීම.**

i විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

ii නව උපාධි පාඨමාලා අනුමත කරගැනීමට අදාලව උසස් ප්‍රමිතීන් හා සම්මත විධි ස්ථාපිත කිරීම මඟින් ඉහළ ගුණාත්මක බවින් යුත් අධ්‍යයන උපාධි පාඨමාලා විශ්වවිද්‍යාල තුළින් ලබාදීමට කටයුතු කිරීම.

iii රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ පවතින "තත්ත්ව ආරක්ෂණ කව" වැඩිදියුණු කිරීම.

iv රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ තත්ත්ව ආරක්ෂණය නිශ්චිත කාල පරාසයක් තුළ අධීක්ෂණ කර ඇගයීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

v රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා එක් එක් උපාධි පාඨමාලාවන්ට අදාළව ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුව (Sri Lanka Qualifications Framework) තුළ, ඊට අදාළවන මට්ටම හඳුන්වා දීම.

vi උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල සඳහා ස්වාධීන තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන ක්‍රමවේදයක් ඇති කිරීමට මූලික පියවර ගැනීම.

**8. විශ්වවිද්‍යාල -කාර්මික ව්‍යාපාර අතර සබඳතාවයන් වර්ධනය කිරීම.**

i GIZ වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල - ව්‍යාපාර කව ස්ථාපිත කිරීමට අවශ්‍ය අනුමැතිය නව චක්‍රලේඛයක් නිකුත් කිරීම මගින් ලබාදීම තුළින් විශ්වවිද්‍යාල සහ කර්මික ව්‍යාපාර අතර සබඳතාවයන් වර්ධනය කිරීම.

ii ශ්‍රී ලංකා සේවා යෝජක සමිති සම්මේලනයේ, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සහ ජාතික වාණිජ මණ්ඩලයේ නියෝජිතයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව හා සමාජීය විද්‍යා ස්ථාවර කමිටුවට සහභාගීවීම කරගැනීම තුලින් ඔවුන්ගේ දැනුම මානව හා සමාජීය විද්‍යා උපාධිධාරීන්ගේ ශක්‍යතා තිරසාර ලෙස වර්ධනය කර ගැනීමට, අවශ්‍ය කටයුතු සැලසීම.

**9. උපාධිධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා කථනය, ලිවීම, සහ සන්නිවේදන හැකියාවන් වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශ ඇති කිරීම.**

**10. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ට විශ්වවිද්‍යාලවල ඉගෙනීමේ කටයුතු සඳහා ඇතුළත්වීමට ප්‍රථම, අන්තර්ජාලය හරහා ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විෂය මාලාවක් හැදෑරීමට අවස්ථාව සලසා දීම සහ එය අවසන් කළ පසු ඒ සඳහා සහතිකයක් පිරි නැමීමට කටයුතු කිරීම.**

**11. ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය හා සාධාරණත්වය, ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවමය ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ විශ්වවිද්‍යාල තුළ නවකවදය වැනි කරුණු පිළිබඳව ඉහළ අවධානයක් යොමු කිරීම.**

i වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කර ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය හා සාධාරණත්වය, ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවමය ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට අදාළ මූලික පියවරයන් ගැනීම.

ii ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සාධාරණත්වය පිළිබඳ නව ස්ථාවර කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාපිත කිරීම.

iii ස්ත්‍රී පුරුෂ සමාජභාවමය, සමානාත්මතාවය හා නවකවදය වැනි සාධක පිළිබඳව වැඩකටයුතු කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාපිත කිරීම.

iv විශ්වවිද්‍යාල සිසුන්ගෙන් ලැබෙන නිර්ණාමික ලිපි / විද්‍යුත් තැපැල් පැමිණිලි සොයා බැලීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම.

v 1998 නවක වද පනතට අනුව ප්‍රචණ්ඩක්‍රියා හා නවකවද ක්‍රියාවල නිරතවීමේ ප්‍රතිවිපාක පිළිබඳව සිසුන් සහ දෙමව්පියන් දැනුවත් බව සහතික කිරීම පිණිස, සිසුන් හා දෙමව්පියන්

විසින් අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ලියාපදිංචි වීමේදි ලබාගැනීම.

මෙම දිවුරුම් ප්‍රකාශය පිළිබඳ විස්තර 2016/2017 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතට ඇතුළත් කර ඇත.

**12. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශිෂ්‍ය, අධ්‍යයන හා අනධ්‍යයන වෘත්තීය සංගම් සමඟ සමීප සංවාදයන් ගොඩනැගීම.**

**13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම් විශ්වවිද්‍යාල තුළ පැවැත්වීම.**

i විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අග නගරයෙන් බැහැරව පවතින විශ්වවිද්‍යාල තුළ වර්ෂයකට අවම වශයෙන් රැස්වීම් හතරක් පමණ පැවැත්වීමට කටයුතු කිරීම. ඒ අනුව, එහි මූලික පියවර ලෙස 2016 ජූලි මස 22 වන දින යාපනය විශ්වවිද්‍යාලය තුළ කොමිෂන් සභා රැස්වීමක් පැවැත්වීම.

**14. විශ්වවිද්‍යාල යටිතල පහසුකම් සංවර්ධනය**

i ඉදිකිරීම් අවසන් ව්‍යාපෘති

- නේවාසිකාගාර -73 (රුපියල් මිලියන 12,943)
- අධ්‍යයන කටයුතු සඳහා වූ ගොඩනැගිලි - 148 (රුපියල් මිලියන 4,406)
- ශිෂ්‍ය සුභසාධන පහසුකම් - 43 (රුපියල් මිලියන 254)
- පරිපාලනමය ගොඩනැගිලි - 9 (රුපියල් මිලියන 282)
- නිල සේවක නිවාස - 55(රුපියල් මිලියන 306)

ii ඉදිවෙමින් පවතින ව්‍යාපෘති

- නේවාසිකාගාර -34 (රුපියල් මිලියන 6,559)
- අධ්‍යයන කටයුතු සඳහා වූ ගොඩනැගිලි - 113 (රුපියල් මිලියන 29,164)
- ශිෂ්‍ය සුභසාධන පහසුකම් - 29 (රුපියල් මිලියන 3,026)
- පරිපාලනමය ගොඩනැගිලි - 5 (රුපියල් මිලියන 667)
- නිල සේවක නිවාස - 11(රුපියල් මිලියන 655)

**15. විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබාදෙන මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර මුදල වැඩි කිරීම.**

එක් විශ්වවිද්‍යාල සිසුවෙකුට ලබාදෙන මහපොළ ශිෂ්‍යත්වය රුපියල් 2,500.00 සිට රුපියල් 5,000.00 දක්වා වැඩි කිරීමටත් ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 2,000.00 සිට රුපියල් 4,000.00 දක්වා වැඩි කිරීමටත් රජය විසින් ගන්නා ලද තීරණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කිරීම.

**16. විශ්වවිද්‍යාල සිසුන්ට පොළී රහිත ණය මුදලක් ලබාදීම.**

විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගණක මිළ දී ගැනීම සඳහා පොළී රහිත ණය මුදලක් ලබාදීමට අදාළ කටයුතු කිරීම සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය වූ සහාය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දීම.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

**2017.01.01**